මා කවර කරුණකින් නුඹලාව වළක්වා ඇත්තේ ද එයින් නුඹලා වැළකෙනු. තවද මා කවර කරුණක් නුඹලාට නියෝග කර ඇත්තේ ද නුඹලාට හැකි පමණින් එය ගෙන එනු. නුඹලාට පෙර සිටියවුන් විනාශ වී ගියේ ඔවුන්ගේ අධික ප්රශ්න කිරීම් හා ඔවුන් නබිවරුන් ගැන දැරූ මතභේද හේතුවෙනි.

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) කළ ප්රකාශයකට මම සවන් දුනිමි යැයි පවසා අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. “මා කවර කරුණකින් නුඹලාව වළක්වා ඇත්තේ ද එයින් නුඹලා වැළකෙනු. තවද මා කවර කරුණක් නුඹලාට නියෝග කර ඇත්තේ ද නුඹලාට හැකි පමණින් එය ගෙන එනු. නුඹලාට පෙර සිටියවුන් විනාශ වී ගියේ
ඔවුන්ගේ අධික ප්රශ්න කිරීම් හා ඔවුන් නබිවරුන් ගැන දැරූ මතභේද හේතුවෙනි.”
[පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

පසුව පෙර සිටි අතැම් ජන සමාජ මෙන් නොවන මෙන් එතුමාණන් අපට අවවාද කළහ. එම සමූහයන් ඔවුන්ගේ නබිවරුන් පිළිබඳ විරුද්ධ මත දැරූ අතරම ඔවුන්ගෙන් අධික ලෙස ප්රශ්ණ කර සිටියෝය. එහෙයින් අල්ලාහ් ව්යසනයන් හා කඩා වැටීම් වැනි විවිධ විනාශයන් තුළින් දඬුවම් කළේය. ඔවුන් එසේ විනාශ කරනු ලැබුවාක් මෙන් අපද විනාශ නොවන පරිදි ඔවුන් මෙන් අප නොවිය යුතුය.

http://www.sunnah.global/hadeeth/si/show/4725